## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - 2016

-----------------------------------------------

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2018 ජනවාරි 17 දින අධිකාරියේ සභාපති වෙත නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-------------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම් ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය ව්‍යාචනය

------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2**

---------------------------------------------

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගෙවූ ආදායම් බදු ලෙස රු.19,701,609 ක් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ මුදලින් ගෙවා තිබූ ආදායම් බද්ද රු.12,336,843 ක් වූයෙන් රු.7,364,766 ක වෙනසක් නිරූපණය විය.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3**

---------------------------------------------

(i) ප්‍රමිතයේ 44 ඡේදය ප්‍රකාරව, ආයතනය විසින් ප්‍රවර්තන කාලපරිච්ඡේදයට බලපෑමක් ඇති කළ හැකි ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්වීමක ස්වභාවය හා අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. එහෙත් 2015 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ සංචාරක සංවර්ධන බදු මුදල ඉක්මවා ලැබූ රු.7,285,607 ක මුදල ප්‍රමිතය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 47 ඡේදය ප්‍රකාරව, පූර්ව කාල පරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීම (Restated) තුළින් නිවැරදි කළ යුතු වුවත් 2015 වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු ආදායම් බදු රු.2,589,072 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7**

---------------------------------------------

ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව, දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරන්නේ නම් අදාළ වත්කම අයත් කාණ්ඩයේ සියලුම දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ යුතුය. එසේ වුවත්, අධිකාරිය සතු සියලුම ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමකින් තොරව ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල පමණක් 2008 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර රු.මිලියන 1,378 ක් වූ ප්‍රත්‍යාගණන අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. අනෙකුත් ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය නොකිරීම නිසා අධිකාරියේ ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් පිළිඹිබු කර නොතිබුණි.

**(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8**

---------------------------------------------

(i) ප්‍රමිතයේ 44 ඡේදය ප්‍රකාරව, ප්‍රතිපාදනයක් ලෙස හඳුනාගන්නා අගය වාර්තා කරන දිනට ඇති ප්‍රවර්තන බැඳීම පියවීම පිණිස අවශ්‍ය වියදම් වල හොඳම ඇස්තමේන්තුව විය යුතුය. කෙසේ වුවද, ආයතනය රු. 4,845,979 ක බොල් ණය සහ අඩමාන ණය වෙන් කිරීමේදී ණයගැති වයස් විශ්ලේෂණයන් පමණක් සලකා බලා ඇති අතර කේවල ණයගැති ශේෂයන් පිළිබඳව සලකා බලා නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 22 ඡේදය ප්‍රකාරව, අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රවර්ථන බැදීමක් (නෛතික හෝ සම්මුතික ) පවතින විටෙක ඒ සඳහා ප්‍රතිපාදන කළ යුතුය. එහෙත් 2006

ජනවාරි සිට 2016 ජූනි දක්වා සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීමේදී ජීවන වියදම් දීමනාව සහ අයවැය විශේෂ දීමනාව නොසලකා හැරීම හේතුවෙන් දායක මුදල් ලෙස රු.5,695,393 ක් සහ ඊට අදාළ දඩ මුදල් ලෙස රු.2,786,538 ක් වශයෙන් එකතුව රු.8,481,931 ක් ගෙවිය යුතු බව 2017 පෙබරවාරි 16 දින වන විටත් සේවා නියුක්තයින්ගේ භාර අරමුදල මගින් දැනුම් දී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 100 ඡේදය ප්‍රකාරව වාර්තා කරන දිනට ඇති සෑම අසම්භාව්‍ය වගකීමක ස්වභාවය පිළිබඳ විස්තරයක් හෙළිදරව් කළ යුතුවේ. 2006 ජනවාරි සිට 2016 ජූනි දක්වා සේවක අර්ථ සාධක දායක මුදල් ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සහ අයවැය විශේෂ දීමනාව නොසලකා දායක මුදල් ගණනය කර ගෙවීම හේතුවෙන් තවදුරටත් සේවාදායක මුදල් ලෙස රු.18,129,721 ක් සහ සේව්‍යදායක මුදල් ලෙස රු.27,194,581 ක් සහ ඊට අධිභාර ලෙස රු.22,249,365 ක් ලෙස මුළු මුදල රු.67,573,667 ක් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු බව අනාවරණය විය. මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලට අදාළ රු.2,809,068 ක බලපත්‍ර හා පරිපාලන ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවලට අදාළ උපචිත වියදම් අධි වෙන් කිරීම් රු.8,325,722 ක්, පෙර වර්ෂ ගැලපීමක් වශයෙන් ගිණුම් ගත කිරීම වෙනුවට ප්‍රවර්තන වර්ෂයේ වෙනත් ආදායම් ගිණුමට බැර කිරීම නිසා ප්‍රවර්තන වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු දැනට භාවිතයේ පවතින පිරිවැය රු.99,821,327 ක්වූ වත්කම් වර්ග 09 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන්කර තිබුණු අතර ඒවා ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අධිකාරිය විසින් වෙනත් ආයතනවල සිදුකරන ලද ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් දරන ලද වියදම් සංවර්ධන පිරිවැය ලෙස හඳුනාගෙන දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර සියයට 10 බැගින් වාර්ෂික ක්ෂය කර තිබුණි. එසේ වුවද, එකී වත්කම් සම්බන්ධයෙන් අධිකාරියට නීත්‍යානුකූල අයිතියක් හා භුක්තියක් නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසානයට එම වත්කම්වලට අදාළ පිරිවැය ලෙස රු. 184,592,443 ක් හා ඒවායේ ශුද්ධ අගය ලෙස රු.33,016,065 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙසේ අයිතිය හා භුක්තියක් අධිකාරිය සතුව නොපවතින වත්කම් සම්බන්ධයෙන් දරන ලද සංවර්ධන පිරිවැය ගිණුම් තැබීමේ ප්‍රතිපත්තියක් සකස් කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

(ඉ) අධිකාරිය සතු ඉඩම් හා තානායම් වෙනත් පාර්ශවයන්ට බදු දී තිබුණ ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඒ සම්බන්ධව හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලැබිය යුතු විවිධ ණය ගැති ශේෂ ලෙස රු.24,448,523 ක් දක්වා තිබුණු අතර ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ ගිණුම් වල එම ශේෂය රු.18,750,304 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ඒ අනුව රු.5,698,219 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) තොග සමීක්ෂණ වාර්තා අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ අවසන් තොග ශේෂය රු.1,974,930 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව රු.1,597,783 ක් වූයෙන් රු.377,147 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත දැක්වෙන විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

| අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු | |
| (අ) ආයෝජන | 55,570,268 | ආයෝජන සහතික හෝ සනාථ කිරීමේ වෙනත් ලිඛිත සාක්ෂි |
| (ආ) ණයගැතියෝ | 152,421,620 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (ඇ) දේපල පිරියත හා උපකරණ | 2,735,922,843 | වත්කම් ලේඛනය, හිමිකම් ඔප්පු / අයිතිය තහවුරු කිරීමේ වෙනත් ලේඛන |
| | 2,943,914,731 | |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබිය යුතු වෙළෙඳ ණය ගැති ශේෂයෙන් රු.5,070,248 ක් වර්ෂ 4කට වැඩි කාලයක් ද රු.2,633,997 ක් වර්ෂ 3කට වැඩි වර්ෂ 4කට අඩු කාලයක් ද රු.7,260,519 ක් වර්ෂයකට වැඩි වර්ෂ 3කට අඩු කාලයක් සහ රු.30,365,685 ක් වර්ෂයකට අඩු කාලයක් සහිත හිඟ ශේෂවලින් සමන්විත වී තිබුණි.

(ආ) එකතුව රු.8,348,414 ක් වූ විවිධ ණයගැතියන් තුළ ඇතුළත් රු.2,888,105 ක් වර්ෂ 4කට වැඩි කාලයක් ද රු.3,572,047 ක් වර්ෂයකට වැඩි වර්ෂ 4කට අඩු කාලයක් ද රු.1,888,262 ක් වර්ෂයකට අඩු කාලයක් ද සහිත හිඟ ශේෂවලින් සමන්විත වී තිබුණි.

(ඇ) පාසිකුඩා පල්දෝරු සේවා නඩත්තු අයකිරීම් සඳහා ලැබිය යුතු රු.6,945,855 ක් වර්ෂ 3 කට වැඩි කාලයක්ද, රු.37,117,725 ක් වර්ෂයකට වැඩි වර්ෂ 3 කට අඩු කාලයක් සහ රු.34,032,995 ක් වර්ෂයකට අඩු කාලයක් සහිත හිඟ ශේෂ වලින් සමන්විත වී තිබුණි.

(ඇ) පාසිකුඩා ජල පරිභෝජන ණයගැතියන්ගෙන් අයවිය යුතු වර්ෂ 3 ට වැඩි ශේෂය රු.3,295,560ක්ද වර්ෂයකට වැඩි වර්ෂ 3 කට අඩු ශේෂය රු.5,029,290 ක්ද වර්ෂයකට අඩු ශේෂය රු. 2,922,314 ක්ද වී තිබුණි.

(ඉ) විවිධ ණයහිමියන්ට ගෙවිය යුතු රු.193,181ක ශේෂයෙන් වර්ෂ 3 ඉක්ම වූ ණය හිමි ශේෂය රු.176,063 ක් විය.

(ඊ) තැන්පතු හා වෙනත් ගෙවිය යුතු ශේෂ ලෙස දක්වා තිබූ රු.40,895,614 ක වටිනාකමින් රු. 6,446,012 ක් වර්ෂ 3 ට වැඩි වර්ෂ 4 ට අඩු කාලයක් සහ රු. 9,120,936 ක් වර්ෂ 4 ට වැඩි කාලයක් සහිත ගෙවිය යුතු රැඳවුම් වලින් සමන්විත වී තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති,රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ IV පරිච්ඡේදයේ 26 වගන්තිය | ප්‍රකාශිත සහ සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත කරගෙන යා හැකි සංචාරක කටයුතු, වාණිජ්‍යා සහ වෙනත් කටයුතු නියම කරමින් නියෝග සාදා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි169(2) | චෙක්පත් උපලබ්ධිවීමට පෙර සේවා සපයා තිබීම හේතුවෙන් රු.585,221 ක් වටිනා චෙක්පත් 21 කට අදාළ මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. |
| (II) මුදල් රෙගුලාසි 757 | වටිනාකම රු.1,880,781 ක් වූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි |
| (II) මුදල් රෙගුලාසි 757 (2) | වත්කම් සමීක්ෂණ වාර්තා අනුව, භාණ්ඩ 67 ක අතිරික්තතා හා භාණ්ඩ 133 ක ඌනතා හඳුනාගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 පරිච්ඡේදයේ 9.14.1 හා 9.14.2 වගන්ති | මානව සම්පත් කළමනාකරණයට අදාළ නීති හා රෙගුලාසි පිළිබඳ සියලු කරුණු ඇතුළත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ අත්පොතක් පිළියෙළ කර භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය සහිතව පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත්, අධිකාරිය එම අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.373,897,908 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 308,312,524 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 65,585,384ක වර්ධනයක් විය. අපගමන බදු ආදායම රු.54,166,025 කින් සහ සංචාරක සංවර්ධන බදු ආදායම රු.36,651,648 කින් වැඩි වීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් සිදුවී තිබුණි. එහෙත් 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් සිදුවී තිබුණු අතර නැවතත් සමාලෝචිත වර්ෂයේදී එය වර්ධනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ රාජ්‍ය බදු නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.286,603,801ක් වූ අධිකාරියේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.527,420,576 ක් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ආදායම රු.මිලියන 678 ක් වූ අතර ඉකුත් වර්ෂයේ දී එය රු.මිලියන 545 ක් වූයෙන් ආදායමෙහි සියයට 24.4 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම, ඉකුත් වර්ෂයේ සංචාරක සංවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු. මිලියන 236 සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා රු.මිලියන 294 ක් වැය කර තිබූ අතර ඒ අනුව වියදමෙහි සියයට 24.6 ක ඉහලයාමක් පෙන්නුම් කෙරුණි.

## 3.3 ආයතනයට එරෙහිව හා ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

රජයේ දේපල අයුතු පරිහරණය කිරීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් බාහිර පුද්ගයන් 11 දෙනෙකුට එරෙහිව අධිකරණයේ නඩු ගොනු කර තිබුණු අතර බාහිර ආයතන හා පුද්ගලයන් විසින් ආයතනයට එරෙහිව අධිකරණයේ නඩු 08 ක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1. කාර්යසාධනය

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ පරමාර්ථ පහත සඳහන් පරිදි වේ.

(අ) ශ්‍රී ලංකාව, ශ්‍රී ලංකාවේ සහ විදේශීයන්හිදී සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන් දියුණු කිරීම.

(ආ) චාරිකා හා සංචාරක කර්මාන්තයට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් සම්පාදිත ප්‍රතිපත්ති ඇතුළත, මෙම ක්ෂේත්‍රයට අදාළව සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයා හට උපදෙස් දීම.

(ඇ) සංචාරක හා චාරිකා ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා අලෙවි කටයුතු කිරීම ශ්‍රී ලංකාවේ සහ විදේශීයන්හි සිදු කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන කාර්යාංශයට මග පෙන්වීම.

(ඈ) මානව සම්පත් පුහුණු කිරීමේ කටයුතු සහ සංවර්ධන කටයුතු භාර ගැනීම, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට මග පෙන්වීම.

(ඉ) ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය කිරීමට සහ ව්‍යාප්ත කිරීමට දායකත්වයක් ලබා දීමේ අරමුණින්, සංචාරක කර්මාන්තය සහ චාරිකා පිළිබඳ ව්‍යාපාරික ක්ෂේත්‍ර නංවාලීමට කටයුතු කිරීම.

(ඊ) සත්කාරක සේවා පිළිබඳ කර්මාන්තයද ඇතුලුව, ප්‍රමාණවත්, ආකර්ශණීය සහ කාර්යක්ෂමව සංචාරක සේවා දැරිය හැකි ආකාරයෙන් වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(උ) සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත වෙනත් කර්මාන්තවලට අදාළව දේශීය වෙනත් කර්මාන්තවලට අදාළව, දේශීයව හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිති වැඩි දියුණු කිරීම, බලාත්මක කිරීම හා පවත්වා ගෙන යාම සඳහා සංචාරක ව්‍යවසායකයන්ට බලපත්‍ර ලබා දීම සහ බලය ලබා දීම.

(ඌ) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට සහ ඒ කර්මාන්තයට සම්බන්ධිත ප්‍රවර්ධනාත්මක කටයුතු සහ පුහුණු කටයුතුවලට සහභාගිවීමට පෞද්ගලික අංශයේ තැනැත්තන් සහ පුද්ගල මණ්ඩල දිරිමත් කිරීම.

(එ) ඉහත පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වන හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සිදු කිරීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අධිකාරියේ අයිතිය හා කළමනාකරණය යටතේ සංචාරක නිවාඩු නිකේතන 04 ක් සහ සංචාරක නිකේතන 03 ක් පැවතුණි. අධික පොදු කාර්ය වියදම හේතු කොටගෙන නිවාඩු නිකේතන 05ක රු. 28,848,309 ක ඌනතාවක් ජනිත වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී සියලුම නිකේතනවල ශුද්ධ පාඩුව රු. 3,900,279 ක් විය.

(ii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් 54 ක් අතුරින් වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණේ ක්‍රියාකාරකම් 49 ක් හෙවත් සියයට 91ක් පමණි. වර්ෂය තුළ ආරම්භ කළ ව්‍යාපෘති සඳහා වෙන්කළ මුදලින් සියයට 10 කට වඩා අඩුවෙන් වැය කළ ව්‍යාපෘති 3 ක්ද, සියයට 50කට වඩා අඩුවෙන් වැය කළ ව්‍යාපෘති 3 ක්ද නිරීක්ෂණය විය. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ උපායමාර්ග 7 ක් යටතේ ව්‍යාපෘති ඉටු කිරීම පිණිස රු.මිලියන 687.62 ක් වෙන් කර තිබුණද වර්ෂය තුළ වැයකර තිබුණේ රු.මිලියන 355.99 ක් හෙවත් සියයට 52ක් පමණි.

(iii) ක්‍රියාකාරකම් 18 ක් සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 158.80කින් කිසිදු මුදලක් වැය කර නොතිබුණද 2016 දෙසැම්බර් 31 දිනට එකී ක්‍රියාකාරකම්වල භෞතික කාර්යසාධනය සියයට 05 සිට සියයට 100 දක්වා පරාසයක දක්වා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

**(අ) ඉඩම් හා දේපල කළමනාකරණය**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වර්ෂ කිහිපයකට පෙර ත්‍රිකුණාමලය කුච්චවේලි ප්‍රදේශයෙන් අධිකාරිය වෙත පවරාගන්නා ලද ඉඩම් අක්කර 510 කට ආසන්න ප්‍රමාණයකින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉඩම් අක්කර 50කට අඩු ප්‍රමාණයක් පමණක් සංවර්ධනය කිරීමට කටයුතු කර තිබුණි.

(ii) සංචාරක සංවර්ධන කටයුතු සඳහා යාල පලටුපාන වන ජීවී ප්‍රදේශයෙන් අධිකාරියට පවරාගෙන ඇති හෙක්ටයාර 448.3 ක භූමියෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ආයෝජකයන් වෙත බදු පදනම මත ලබා දී තිබුණේ හෙක්ටයාර් 26.8 ක් පමණි.

(iii) නියැදි පරීක්ෂාවකට අනුව, තානායම් 56 ක් හා අක්කර 6,495 ක වපසරියක් සහිත ඉඩම් කැබලි 166 ක් ආයතනයට පවරා ගැනීම සඳහා ගැසට් නිවේදන නිකුත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පවරාගෙන තිබුණේ කොටසක් පමණි.

(ආ) නුවරඑළිය නිවාඩු නිකේතනයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.1,166,349 ක මුදලක් ගෙවා තිබුණද අලුත්වැඩියා කටයුතු නිසි පරිදි සිදු කළ බවට සහතිකයක් ලබා දී නොතිබූ අතර කරන ලද අලුත්වැඩියා කටයුතු ගිවිසුම ප්‍රකාරව සිදු කර නොතිබූ බව විගණන සෝදිසි පරීක්ෂාවේදී නිරීක්ෂනය විය.

(ඇ) බණ්ඩාරවෙල නිවාඩු නිකේතනය පිහිටා ඇති අක්කර 22 රූඩ් 1 පර්චස් 17.23 ක භූමි ප්‍රමාණය අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර නිකේතන භූමියේ ඇති මිල අධික ඉහල වටිනාකමින් යුත් ගස් 200 ක් පමණ ඉන්වෙන්ට්‍රිගත කර සුරක්ෂිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි අක්කර 11 රූඩ් 03 පර්.13 ක ඉඩමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2015 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියට රු.65,104,138 ක් ගෙවා තිබුණ ද ඉඩම පවරා ගෙන නොතිබුණු අතර 2017 වර්ෂයේදී නැවත අධිකාරියට එම මුදල් ආපසු ලබා දී තිබුණි. එසේ වුවද, මෙම ඉඩමෙහි ආරක්ෂණ වියදම් සඳහා රු.843,772 ක් හා ඉඩමේ මායිම් වැට, ලඳු කැලෑ සුද්ද කිරීම, නාම පුවරු සවි කිරීම සහ ඉඩම් සැලැස්මේ පිටපතක් ලබා ගැනීම සඳහා රු.551,155 ක් අධිකාරිය විසින් වැයකර තිබුණි.

(ඉ) පාසිකුඩා නිවාඩු නිකේතනයේ පල්දෝරු පද්ධතිය පවත්වාගෙන යාම සඳහා සේවා සපයනු ලබන ආයතනයක් සමග ගිවිසුමකට එළඹ තිබුණු අතර, ඒ අනුව සේවය ලබාගත් හෝටල් වලින් අයකරනු ලබන ගාස්තුව මාසයක් ඇතුළත සේවා සපයන ආයතනය වෙත ගෙවිය යුතු වේ. එසේවුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනට ඉහත කී සේවය සඳහා හෝටල් වලින් ලැබිය යුතු මුදල රු.78,096,574 ක් හා සේවා සපයන ආයතනයට ගෙවිය යුතු මුදල රු. 86,305,593 ක් වූයෙන් රු.8,209,019ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු අනාවරණය නොවීය.

තවද සේවා සපයන ආයතනයෙන් ලද සනාථ කිරීම් අනුව 2016 දෙසැම්බර් 31 දිනට රු.95,323,810 ක් අධිකාරියෙන් ලැබිය යුතු බව දක්වා තිබුණු අතර අධිකාරියේ ගෙවිය යුතු ගිණුම් අනුව එය රු.86,305,593 ක් විය. මේ අනුව රු.9,018,217 ක වෙනසක් නිරීක්ෂණය විය.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

අධිකාරිය විසින් සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා සංචරණ සුහසාධක සංගමය වෙත 2014 සැප්තැම්බර් 03 දින රු.5,738,075 ක් ලබා දී තිබුණි. උක්ත ප්‍රවර්ධන වැඩසටහන බලංගොඩ, දෙහිඅත්තකන්ඩිය, පදියතලාව, හසලක, ලුණුගම් වෙහෙර හා නුවරඑළිය යන ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම සඳහා එම මුදලින් රු.4,302,468 ක් වැය කර තිබූ අතර ඉතිරි මුදල වන රු. 1,435,607 ක් මෙම වාර්තාවේ දින දක්වාම අධිකාරියට ලබා ගැනීමට කටයුතු නොකර සුහසාධක සංගමය භාරයේ තබා ගැනීමට ඉඩහැර තිබුණි.

**4.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1969 වර්ෂයේදී සංචාරක කර්මාන්තය සඳහා ලංකා සංචාරක මණ්ඩලයටද, පසුව සංචාරක සංවර්ධන අධිකාරියට පවරා දෙන ලද බෙන්තොට සංචාරක නිවාඩු නිකේතනයට අයත් අක්කර 94 ක පමණ භූමියෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම උපයෝජනය කර තිබුණේ අක්කර 54 ක පමණ භූමි ප්‍රමාණයකි. මේ අනුව වර්ෂ 46 කට වැඩි කාලයක් අක්කර 40 කට වැඩි භූමි ප්‍රමාණයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) බෙන්තොට ජාතික නිවාඩු නිකේතන භූමියේ පිහිටි වර්ග අඩි 2880 ක පමණ ගොඩනැගිලි ඉඩ ප්‍රමාණයක් 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ආර්ථිකමය කටයුත්තකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

**4.5 ආර්ථික නොවන ගනුදෙනු**

බිබිල, රාගල, හොරව්පතාන, මහියංගනය, වීරකැටිය, බත්තුළුඔය සහ නිකවැරටිය යන ප්‍රදේශවල වර්ෂ 04කට අධික කාලයක සිට නිවාඩු නිකේතන 7 කආරක්ෂක කටයුතු සඳහා රු.9,940,380 ක් පමණ වැය කර තිබුණි. එහෙත් මෙම නිකේතන ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි.

**4.6 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාසිකුඩා සංචාරක නිකේතන ව්‍යාපෘතියේ වැසි වතුර බැස යාමේ කාණු පද්ධතිය ඉදිකිරීම් භෞතිකව පරීක්ෂා කිරීමේ දී අදාළ භූමියේ භූ විෂමතාව සැලකිල්ලට ගෙන ඉදිකිරීම් සිදු නොකිරීම හේතු කොටගෙන කාණු පද්ධතියේ ජලය රැඳී තිබෙන බව විගණනයට නිරීක්ෂණය වූ අතර විගණනයේදී ගණනය කළ තත්‍ය මිනුම් වාර්තා, බිල්පත්වල සඳහන් ගෙවීම් ප්‍රමාණයන් සමග සැසඳීමේදී රු.3,792,420 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියේ "වන් ස්ටොප්" ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව රු.699,300 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම මුදල ආපසු අය කර ගෙන නොතිබුණි.

(ඇ) 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛයේ 8 ඡේදයේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා වන නිර්දේශවලට පටහැනිව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා බෙන්තොට පල්දෝරු පද්ධතිය ක්‍රියාත්මක

කිරීමේ ශ්‍රම කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන පරිපාටියෙන් තොරව පුද්ගලික ආයතනයක් වෙත පවරා දී තිබුණි.

(ඇ) පාසිකුඩා සංචාරක කලාපයේ ජාතික නිවාඩු නිකේතනයේ කිලෝමීටර් 1.126 ක පිවිසුම් මාර්ගය කාපට් කිරීමේ පිරිවැය ඇස්තමේන්තුව ව්‍යාජ ලෙස අදියර 04 කට පිළියෙල කර ප්‍රසම්පාදන පරිපාටි අනුගමනය කිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබූ අතර ඉදිකිරීම් සඳහා රු.22,013,564 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා මෙම මුදල ආපසු අය කර ගෙන නොතිබුණි.

## 4.7 ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

අතිරේක කාමර 4,000ක් සහිත නිවාඩු නිකේතන ඉදිකිරීම සහ යටිතල සහසුකම් ඇති කිරීම පිණිස ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 5,521 ක් වූ කල්පිටිය ඒකාබද්ධ සංචාරක ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය වර්ෂ 5කින් නිම කිරීම සඳහා 2008 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ මහා භාණ්ඩාගාරයේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් කිසිදු ඉදිකිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සහ ව්‍යාපෘතියේ කළමනාකරණ වියදම්, උපදේශන හා ප්‍රාග්ධන වැඩ යනාදිය ආවරණය වන පරිදි විස්තරාත්මක අයවැයක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතිය යටතේ, දූපත් 14 ක් ආයෝජකයින් වෙත ලබා දීමට අධිකාරිය යටතට පත්කර ඇති අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ආයෝජකයින් වෙත ලබා දී තිබුණේ දූපත් 3ක් පමණි.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව කල්පිටිය සහ දෙද්දූව ප්‍රදේශවල ඉඩම් අත්පත් කරගැනීම සඳහා එම ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත 2007 වර්ෂයේදී රු.මිලියන 71 ක අත්තිකාරම් මුදල් ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම එම ඉඩම් අත්පත් කරගෙන නොතිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුරු නාම 19 ක් යටතේ තනතුරු 218 ක් ලෙස අධිකාරියේ කාර්යය මණ්ඩලය අනුමත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ තත්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 177 ක් සහ 180 ක් විය.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------------

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණත් එම කාර්යයන් ඉටු කර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව විෂයයන් 18 ක විගණන කටයුතු සැලසුම් කර තිබූ නමුත් ඉන් විෂයයන් 11 ක විගණනය සිදු කර නොතිබුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(අ) අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 23 ක අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 20 සිට සියයට 368 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව මේ දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.6 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 1 පරිච්ඡේදයේ 12(4) (iii) වගන්තියට අනුව අදාළ අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව පෞද්ගලික හෝටලයක් වෙත රාජ්‍ය බැංකුවකින් ලබාදුන් රු.මිලියන 100 ක ණය මුදලට අදාළ 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ පොලියෙන් රු.7,382,305 ක් අධිකාරිය විසින් ගෙවා තිබුණි.

(ආ) කල්පිටිය තොරයිඅඩි ජැටිය ඉදිකිරීම සහ වන්නිමුන්දලම කලපුව අසල තාර දැමීම සඳහා කළුගල්,බොරළු හා ඒ.බී.සී.සැපයීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වෙළෙඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ, කළුගල් සැපයීමට තෝරාගත් සැපයුම්කරු වෙනුවට ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි වෙනත් පුද්ගලයෙකුගෙන් කළුගල් කියුබ් 1648 ක් වැඩි මිලට මිලදී ගැනීම නිසා රු.824,000 ක් වැඩිපුර දැරීමට සිදුවී තිබුණ අතර එම මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම අයකරගෙන නොතිබුණි.

(ii) කල්පිටිය වැඩබිමට කළුගල්, බොරළු සහ ඒ.බී.සී සැපයීම සඳහා යොදාගත් බවට සඳහන් ටිපර් රථයක ධාරිතාවය කියුබ් 3 ක් වුවද කියුබ් 4 බැගින් ද්‍රව්‍ය සැපයූ ලෙස සලකා ගෙවීම් කිරීම නිසා වැඩිපුර ගෙවූ රු.2,549,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) කළුගල් කියුබ් 1648 ක්, ඒ.බී.සී කියුබ් 368 ක් සහ බොරළු කියුබ් 40 ක් ලෙස භෞතිකව භාර නොගත් ද්‍රව්‍ය වටිනාකම වූ රු.10,196,000 ක් සඳහා අධිකාරිය විසින් ගෙවීම්කර තිබුණි.

(ඈ) කතරගම සංචාරක නිවාඩු නිකේතනයේ සිදුකළ අළුත්වැඩියා කටයුතුවලට වැඩිපුර ගෙවන ලද රු.11,089,228 ක් වගකිව යුතු නිලධාරීන්ගෙන් මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

(ඇ) කල්පිටිය මොහොට්ටුවාරම ජැටිය ඉදිකිරීමේ කටයුතු සඳහා ඩෝසර් යන්ත්‍ර සැපයූ බවට සැපයුම්කරුවන් ඉදිරිපත් කළ ලිපි තුනක් පදනම් කරගෙන පැය 941.7 ක් සඳහා රු.3,226,950 ක මුදලක් ගෙවා තිබුණි. එහෙත් මෙම ඩෝසර් යන්ත්‍ර සේවය ලබාගත් බවට දිනපතා මනු කියවා වැඩ පැය සටහන් කර එම වැඩ පැය වාර්තා අධිකාරියේ නිලධාරියෙකුගෙන් සහතික කර ගැනීමකින් තොරව මෙම ගෙවීම සිදුකර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති වැඩ පරීක්ෂක විසින් ට්‍රැක්ටර් සේවාව සතුටුදායක ලෙස ලබා ගත් බවට උක්ත ලිපි තුනේ සහතික කර තිබුණි.

(ඉ) බෙන්තොට නිවාඩු නිකේතන කළමනාකරු විසින් 2012 හා 2013 යන වර්ෂවල ලේඛනගත කිරීමකින් තොරව වැටුප් රහිත නිවාඩු 65½ ක් ලබාගෙන කළමනාකරණයට නොදන්වා එම වර්ෂ දෙකේදීම ඉතිරිකරගත් නිවාඩු දීමනා ලෙස රු. 80,960 ක් ලබාගෙන තිබුණි.

(ඊ) බෙන්තොට නිවාඩු නිකේතන කළමනාකරු විසින් ව්‍යාජ අංකයන් සඳහන් වාහනයක් සඳහා වසරක කාලසීමාවකට ආයතන දෙකකට වාහන කුලිය ලෙස රු. 480,000ක් සහ ඉන්ධන රු.128,226 ක් ලෙස මුළු මුදල රු. 608,226 ක් නීති රීති රෙගුලාසිවලින් බැහැරව ගෙවා තිබුණි.

(උ) අධිකාරිය විසින් අවශ්‍යතාවය ඇගයීමකින් තොරව සෝපා පුටු 55 ක් මිලදී ගැනීමට රු.2,659,875 ක් වැයකර තිබුණි. මෙම පුටු මිලදී ගැනීමට සීමිත මිල ගණන් කැඳවා තිබුණද ආදර්ශ පුටුව සැපයූ ආයතනයෙන් මිල ගණන් ලබා ගෙන නොතිබුණි. පුටු මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය පටහැනිව අත්තිකාරම් ලෙස මුළු සැපයුම් වටිනාකමින් සියයට 50 ක් ගෙවා තිබුණ අතර අවස්ථා කීපයකදී පුටු ප්‍රවාහනය වෙනුවෙන් රු.211,000 ක නිශ්කාර්ය වැයක්ද දරා තිබුණි.එසේම රු.159,803 ක් වටිනා පුටු 03 ක් අස්ථානගත වී තිබුණි.

(ඌ) එක්සත් ජනපද ඩොලර් මිලියන 30 ඉක්ම වූ ව්‍යාපෘතියක් වශයෙන් කල්පිටිය ඒකාබද්ධ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය වර්ගකර වැටුප් හා දීමනා ගෙවා තිබීම හේතුවෙන් 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා නිළධාරීන් වෙත වැඩිපුරගෙවා තිබූ රු.3,780,253 ක මුදල අධිකාරියට අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(එ) අධිකාරිය සතු කොළඹ පිහිටි සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල (Dutch Hospital) ක්ෂය ප්‍රතිපාදන අඩුකළ වටිනාකමට වඩා රු.7,274,715 ක් අඩුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට පවරා තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මෙහෙයුම් පාලනය | සංවර්ධන වැඩසටහන් අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සිදුකිරීම හා භෞතික ප්‍රගතිය පිළිබඳ ව වාර්තා කිරීමට වැඩපිළිවෙලක් සකස්කර නොතිබීම. |

| | | |
|---|---|---|
| (ආ) | ව්‍යාපෘති පාලනය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඒවා අධීක්ෂණය හා ගෙවීම් නිර්දේශ කිරීමේදී හා අනුමත කිරීමේදී කළ වැඩ වාර්තා පරීක්ෂාවකින් තොරව ගෙවීම් සිදුකර තිබීම. |
| (ඇ) | වත්කම් කළමනාකරණය | වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම හා වත්කම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ පාලනය | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඉ) | ගිණුම්කරණය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීමේදී දෝෂ පැවතීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් නොකිරීම හා ප්‍රාග්ධන වත්කම් ගිණුම් තැබීමට අදාළ මූලික ලියකියවිලි නොමැතිව ගිණුම් තැබීම් සිදුකර තිබීම. |